
WWW.OLEVELAPI.COM

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2014

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

### ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- ❖ උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- ❖ සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
- ❖ ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

**බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)**

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තර පත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරුව උත්තර පත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.

කවුළු පත්‍රය පිළිතුරු පත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර ✕ ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා : $\frac{60}{100}$ $\frac{20}{30}$

**ව්‍යුහගත රචනා හා රචනා උත්තර පත්‍ර**

- ❖ අයදුම්කරුවන් විසින් උත්තර පත්‍රයේ හිස්ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ❖ ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතුවේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්න පත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්න පත්‍ර තුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්න පත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.

උදාහරණ : මුළු ලකුණු 100

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 100 | I පත්‍රය 40 | II පත්‍රය 60 |
|---|---|---|---|
| 44 | 44 | AB | 44 |

| අවසාන ලකුණු 100 | මුළු ලකුණු 200 | I පත්‍රය 100 | II පත්‍රය 100 |
|---|---|---|---|
| 31 | 62 | 62 | AB |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා**

❋ කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටු වලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

(උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

❋ කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

❋ කිසියම් අයදුම්කරුවකුගේ උත්තර පත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

❋ කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

**මෙවැනි අවස්ථාවල දී**

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තර පත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස් වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමග □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

**ප්‍රශ්න අංක 03 -** (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

WWW.OLEVELAPI.COM

සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තර පත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. සියල්ල ම ලකුණු කොට ලකුණු මුල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂාකාරී ව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තර පත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තර පත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මුල් පිටුවේ එකතු කර ඇති මුළු ගණනට සමානදැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තර පත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තර පත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මුල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

| (අ) | | (ආ) | | (ඉ) | |
|---|---|---|---|---|---|
| (i) | $\frac{54}{100}$ | (i) | $\frac{22}{40}$ | (i) | $\frac{60.5}{100}$ |
| (ii) | $\frac{67}{100}$ | (i) | $\frac{34}{60}$ | (i) | $\frac{81}{100}$ |
| (iii) | $\frac{36}{100}$ | | | | |
| 3 | 157 | | | 2 | 141.5 |
| | 52.33 | | | | 70.75 |
| | 52% | | 56% | | 71% |

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

# අභිමතාර්ථ
## I පත්‍රය
## 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය

මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ ප්‍රශ්න හතළිහකින් සමන්විත වේ. මෙහිදී අපේක්ෂකයින්ගේ අවබෝධය, ස්මරණය, නිරවුල් දැනුම, භාෂා පරිචය හා භාවිතය පිළිබඳ ප්‍රමාණවත් දැනුමක් අපේක්ෂා කෙරේ.

## II පත්‍රය

මෙය ප්‍රශ්න පහකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නය කෙටි උත්තර අපේක්ෂිත ප්‍රශ්න 10 කින් යුක්ත වෙයි. මෙහි දී සිංහල භාෂාවේ වචන කෝෂය ව්‍යාකරණ ආදිය පිළිබඳ දැනුම අපේක්ෂා කෙරේ. 2 වන ප්‍රශ්නය රචනා ලිවීමේ හැකියාව මැන බලන්නකි. දී ඇති රචනා මාතෘකා හතරෙන් එකක් යටතේ රචනාවක් ලිවීමත්, යෝග්‍ය මාතෘකාවක් යෙදීමත් අපේක්ෂා කෙරේ. මෙහිදී අපේක්ෂකයාගේ නිර්මාණ හා චින්තන ශක්තිය, ලේඛන කුසලතාව, නිරවුල් භාෂා භාවිතය, සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මැන බැලීම ආදි අරමුණු කෙරෙහි අවධානය යොමු වෙයි.

3 වැනි ප්‍රශ්නය සාරාංශකරණය යි. දී ඇති ඡේදයක් සංක්ෂේප කොට ලියා දැක්වීම මෙහිදී අපේක්ෂා කෙරේ. අපේක්ෂකයින්ගේ සංශ්ලේෂණ හා විශ්ලේෂණ හැකියාව මෙන්ම භාෂා භාවිතය පිළිබඳ දැනුම ද මෙහිදී පරීක්ෂා කෙරේ.

4 වන ප්‍රශ්නය අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා අවබෝධය පරීක්ෂා කෙරෙන්නකි. මේ සඳහා නිර්දිෂ්ට ඡේදයක් ආශ්‍රයෙන් ප්‍රශ්න ඉදිරිපත් කෙරේ. මේ ප්‍රශ්න මනාව අවබෝධ කරගෙන නිවැරදි පිළිතුරු ලිවීම අපේක්ෂිත යි.

5 වන ප්‍රශ්නයේ දී අපේක්ෂකයින් විවිධ ලේඛන ලිවීමේ දී දක්වන දක්ෂතාව, ප්‍රායෝගික ලේඛන කුසලතාව විමසා බැලේ. මෙහි එක් ප්‍රශ්නයක් වන්නේ අත් පත්‍රිකාවක් සැකසීමයි. එහිම අනෙක් ප්‍රශ්නය වනුයේ පුවත්පත් වාර්තාවක් පිළියෙල කිරීම යි. මෙබඳු ප්‍රශ්න මගින් නූතන සමාජයෙහි විවිධ ප්‍රායෝගික ලේඛන පිළිබඳ අධ්‍යයනය හා ඒවා සිත්ගන්නා පරිදි ලියා දැක්වීමත් පිළිබඳ අපේක්ෂකයින්ගේ කුසලතාව විමර්ශනය කෙරේ.

## III පත්‍රය

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් සමන්විත වෙයි. 1 ප්‍රශ්නයේ කොටස් දහයකි. මෙහිදී නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ අවබෝධය පරීක්ෂා කෙරේ.

WWW.OLEVELAPI.COM

2 වන ප්‍රශ්නය යොමුවන්නේ නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදූ භාෂාවේ අර්ථාවබෝධය පිළිබඳ අපේක්ෂකයින් සතු දැනුම පරීක්ෂා කිරීමටයි. 3, 4 ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ පිළිබඳ අපේක්ෂකයින්ගේ විශ්ලේෂණාත්මක දැනුම පරීක්ෂා කිරීම සඳහා යොමුවෙයි.

5,6,7 ප්‍රශ්නවලින් අපේක්ෂකයින් පිළිතුරු සැපයිය යුත්තේ එකකට පමණි. මෙහි අභිමතාර්ථය වනුයේ නිර්දිෂ්ට ග්‍රන්ථ ආශ්‍රිතව අපේක්ෂයින් තුළ පවත්නා විශ්ලේෂණාත්මක, විචාරාත්මක හා තර්කානුකූල දැනුම මැන බැලීමයි.

සමස්තයක් වශයෙන් සැලකීමේ දී සිංහල I, II හා III ප්‍රශ්න පත්‍ර අපේක්ෂකයින්ගේ භාෂා ඥානය හා සාහිත්‍යාවබෝධය පරීක්ෂා කිරීම සඳහා යොමු වන බව සඳහන් කළ යුතුය.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2014 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2014 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2014**

| | | |
|---|---|---|
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** | **I, II** | **පැය තුනයි** |
| சிங்களமொழியும் இலக்கியமும் | **I, II** | மூன்று மணித்தியாலம் |
| Sinhala Language and Literature | **I, II** | *Three hours* |

## සිංහල භාෂාව හා සාහිත්‍යය I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට උත්තර සපයන්න.** මෙම ප්‍රශ්න පත්‍රය සඳහා **ලකුණු 40ක්** ලැබේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** උත්තරවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** උත්තරය තෝරන්න.

(iii) **ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

(iv) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- අංක **1** සිට **3** තෙක් ප්‍රශ්නවල එක් එක් වාක්‍යයෙහි **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථයට **වඩාත් සමීප අර්ථය** දෙන වචනය තෝරන්න.

**1.** මිතුරන් **අත දීම** නිසා ඔහු ඉක්මනින් දියුණු වූයේ ය.
(1) අතට අත දීම (2) උපකාර කිරීම (3) මුදල් දීම (4) ණය දීම

**2.** නැදැයින් පැමිණ **ආපයින් ම ගිය එක** ගැන තාත්තා නොසතුටින් කතා කළේ ය.
(1) ඉක්මනින් ආපසු යාම (2) පැමිණි ආකාරයට ම ආපසු යාම
(3) පැමිණි වාහනයෙන් ම යාම (4) නොසතුටින් ආපසු යාම

**3.** ඔහු **අර අඳින්නේ** මා අමාරුවේ දැමීමට ය.
(1) සිහින මවන්නේ (2) කතා කරන්නේ
(3) සූදානම් වන්නේ (4) පැමිණෙන්නේ

- අංක **4** සිට **6** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට **වඩාත් සුදුසු** පදය තෝරන්න.

**4.** කවියකු සිය නිර්මාණ තුළින් රසිකයාට ඉදිරිපත් කරන මූලික අභිප්‍රාය ............................ නමින් හැඳින්වේ.
(1) ඖචිත්‍යය (2) වාක්චිත්‍ර (3) භාවාකල්පය (4) රසභාව

**5.** ජන කවිය ඇතැම් ප්‍රබුද්ධ කවියේ පවා නැති රස ජනනය කිරීමේ .................... හිමි කරගෙන ඇත.
(1) ගම්‍යතාවක් (2) ශක්‍යතාවක් (3) යෝග්‍යතාවක් (4) අවශ්‍යතාවක්

**6.** සිංහල භාෂා විකාශනය පිළිබඳ ව කරන තත්ත්ව .................... ශිලාලිපි ඉතා වැදගත් වේ.
(1) අධීක්ෂණයක දී (2) ප්‍රතීක්ෂණයක දී
(3) පුනරීක්ෂණයක දී (4) පරීක්ෂණයක දී

**7.** අකාරාදි පිළිවෙළ **නිවැරදි ව** යෙදී ඇති පද පේළිය තෝරන්න.
(1) අභ්‍යන්තර, අයහපත, කීර්තිය, කාර්යක්ෂම (2) උපශාන්ත, උරුමය, ගායනය, ගැටලුව
(3) එක්සත්, එළිය, මිරිවැඩි, මියුරු (4) ආරංචිය, ආධුනික, චංචල, චාරිත්‍රය

**8.** සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති වාක්‍යය තෝරන්න.
(1) විශ්වය තරණය කිරීමට තරම් විශිෂ්ට වූ විද්‍යාත්මක ඥානයක් මිනිසාට උරුම වූයේ භාෂාව නිසා ය.
(2) සිංහල ගීතයේ යතාර්ථවාදී ප්‍රවණතාවෙහි දක්නා ලද විශේෂත්වය නම් ගීතය මගින් මිනිසුන් අතර සබඳතා සියුම් ලෙස නිර්මාණය කිරීමට ගන්නා ලද වෑයමයි.
(3) ඉකුත් දශක දෙක තුළ අපගේ සිංහල ගීතයේ ඇති වූ ප්‍රධානතම විපර්යාසය නම් එය භාවපූර්න සුනිශිත සාහිත්‍ය නිර්මාණයක් බවට පත් වීමයි.
(4) සංගීතය නමැති ආයුධය මනුශ්‍යයන්ගේ ඇතැම් ඉන්ද්‍රියයන්වල දළ ගතිය නැති කොට ඒවා මටසිලිටු කරන්නට ශක්තියක් ඇති එකක් බව දැන් ප්‍රත්‍යක්ෂ වී තිබේ.



WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

9. ගීතය ගායනා කරන්නී ගායිකාවකි. යන වාක්‍යයේ **කරන්නී** යනු,
(1) නිපාතයකි. (2) කෘදන්තයකි. (3) විශේෂ්‍යයකි. (4) මිශ්‍ර ක්‍රියාපදයකි.

10. සමාජයට ආදර්ශවත් පුද්ගලයකු වශයෙන් ජීවත් වීමට සියලු දෙනා සිතට ගත යුතු ය. යන වාක්‍යයේ ඇතුළත් **තද්ධිත** පදයක් වන්නේ,
(1) සමාජයට යන්නයි. (2) සියලු දෙනා යන්නයි.
(3) සියලු යන්නයි. (4) ආදර්ශවත් යන්නයි.

11. **අනුක්ත නාමපද** පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) මිනිසුන්, කාන්තාවන්, සතුරන්, අපි (2) අප, නිළියක, විශ්‍රාමිකයන්, ගුරුවරුන්
(3) විද්වත්හු, උගතුන්, ශිෂ්‍යයන්, ඔවුහු (4) මා, මවක්, දියණියක්, දරුවන්

12. පොලිස් නිලධාරියා සොරා දෙස විමසිල්ලෙන් බැලුවේ ය. යන වාක්‍යයේ **විමසිල්ලෙන්** යනු,
(1) පූර්ව ක්‍රියාපදයකි. (2) නාම විශේෂණයකි.
(3) නිපාත පදයකි. (4) ක්‍රියා විශේෂණයකි.

13. "බොහෝ කාලයක් පවතින" යන යෙදුම සඳහා වඩාත් සුදුසු තනිපදය වන්නේ,
(1) චිරස්ථායි යන්නයි. (2) සර්ව කාලීන යන්නයි.
(3) සමකාලීන යන්නයි. (4) යාවත් කාලීන යන්නයි.

• අංක 14 සිට 16 තෙක් ප්‍රශ්නවල **තදකළ අකුරෙන්** මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

14. වැව් ඉස්මත්තේ ඇති කුඩා වන රොද ස්වභාවධර්මයා දායාද කළ **ජල පිරිපහදුවක්** වැන්න.
(1) ජල නිෂ්පාදනකරණයක් (2) ජලය රඳවා ගන්නා තැනක්
(3) ජල පරිශුද්ධිකාරකයක් (4) ජලය ආරක්ෂා කරන තැනක්

15. මද්‍රී දේවිය **දුර්මුඛ විලාශයක්** පාමින් හුන්නා ය.
(1) කළකිරුණු ස්වභාවයක් (2) කෝප සහගත බවක්
(3) සොම්නස් සහගත බවක් (4) නිශ්ශබ්දතාවක්

16. නව මන්දිරයෙහි **පශ්චිම පාර්ශ්වය ද** දැකුම්කලු විය.
(1) නැගෙනහිර පැත්ත (2) ඉදිරිපස (3) කෙළවර (4) බටහිර පැත්ත

17. 'අනුබල' යන වචනය අයත් වන්නේ,
(1) විභක්ති සමාසයටයි. (2) අව්‍යය සමාසයටයි.
(3) අන්‍යාර්ථ සමාසයටයි. (4) විශේෂණ සමාසයටයි.

18. උචිතානුචිත, රසාස්වාදය, ඇද්දළ, නරනිඳු යන පද නිවැරදි ව **විසන්ධි** කර ඇති වරණය තෝරන්න.
(1) උචි + තානුචිත, රස + ආස්වාදය, ඇද් + දළ, නර + නිඳු
(2) උචිත + අනුචිත, රසාස් + වාදය, ඇත් + දළ, නර + නිඳු
(3) උචිත + අනුචිත, රස + ආස්වාදය, ඇත් + දළ, නරන් + ඉඳු
(4) උචිතා + නුචිත, රස + ආස්වාදය, ඇද් + දළ, නරන් + ඉඳු

WWW.OLEVELAPI.COM

19. මුලින් දැක්වෙන පදයට සමානාර්ථයක් **නොදෙන** පදයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) හිරු – දිනිඳු, දිනකර, රවි, හිමකර (2) ජලය – අඹ, දිය, දල, පැන්
(3) චන්ද්‍රයා – තරිඳු, සඳ, සොම්, සිසි (4) ලෝකය – ජගත්, දිය, භුවන, ලොව

20. **විරුද්ධාර්ථවත්** පද යුගල සහිත වරණය තෝරන්න.
(1) උච්ච – උත්කෘෂ්ට (2) කුලීන – වංශවත් (3) තිත්ත – කටුක (4) ආලෝක – තිමිර

21. 'ප්‍රවීණ කලාකරුවන් සම්මාන ප්‍රදානෝත්සවයට පැමිණියහොත් සංවිධායකයෝ සතුටු වෙති.' යන වාක්‍යයේ පැමිණියහොත් යනු,
(1) අසම්භාව්‍ය ක්‍රියාපදයකි. (2) පූර්ව ක්‍රියාපදයකි.
(3) මිශ්‍ර ක්‍රියාපදයකි. (4) අතීත කාල ක්‍රියාපදයකි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

22. **වැරදි** අදහස සහිත වරණය තෝරන්න.
(1) සරතැස යනු වෙහෙස යන්නට පර්යාය පදයකි.
(2) දක්ෂ ශිෂ්‍යයෝ ප්‍රශංසා ලබති. යන වාක්‍යයේ දක්ෂ යනු නාම විශේෂණයකි.
(3) අවතක්සේරුව යන පදයේ අව යනු උපසර්ගයකි.
(4) කම්හලෙහි කම්කරුවන් නැත. යන වාක්‍යය ව්‍යාකරණානුකූලව නිවැරදි ය.

23. සඤ්ඤක අකුරු ඇතුළත් වරණය තෝරන්න.
(1) ඟ, ජ ඬ, ඳ, ඹ
(2) ඞ, ඤ, ණ, න, ම
(3) ය, ර, ල, ව
(4) ශ, ෂ, ස, හ, ළ

24. මුලින් දී ඇති ව්‍යාකරණ ප්‍රවර්ගයට අයත් **නො වන** පදයක් සහිත වරණය තෝරන්න.
(1) ක්‍රියාපද – නිදුක් වේවා, නටන්න, යමින්, කරද්දී
(2) සන්ධි – නුවනග, දකුණත, ඔවුනොවුන්, ප්‍රේක්ෂකාගාරය
(3) නිපාත – වහා, යළි, හෙවත්, අනු
(4) තද්ධිත – සාමාජික, රුසියානු, ඖචිත්‍යය, රන්මුවා

- අංක **25** සිට **27** තෙක් දී ඇති එක් එක් ප්‍රකාශනයෙහි අදහසට **වඩාත් ගැළපෙන** ප්‍රස්තාව පිරුළ තෝරන්න.

25. තවත් කෙනකුගේ උපකාරයෙන් තමන්ගේ කටයුතු කර ගැනීම
(1) අගේ ඉදත් කන කෑම
(2) අනුන්ගෙ පානෙන් එළිය බැලීම
(3) දිය යටින් ගින්දර ගෙන යාම
(4) එල්ලෙන්න යන මිනිහා ලාබෙට කඹ සෙවීම

26. නිෂ්ඵල උත්සාහයක් දැරීම
(1) ගඟින් වතුර බී මුහුදට ආවැඩීම
(2) ගලෙන් පට්ටයක් ගැනීම
(3) බීරි අලින්ට වීණා ගායනා කිරීම
(4) බළලුන් ලවා කොස් ඇට බෑම

27. කිසියම් කාර්යයක් අපිළිවෙළට සිදු කිරීම
(1) කුරුල්ලන්ට වැටක් බැන්දා වගේ
(2) දොඩම් ගොඩ බදා ගත්තා වගේ
(3) නටන්ට බැරි මිනිහාට පොළොව ඇදයි වගේ
(4) යකාගේ කටේ දත් හිටෙව්වා වගේ

- අංක **28** සිට **30** තෙක් ප්‍රශ්නවල **ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය** තෝරන්න.

28. (1) කවියන් හෙවත් නිර්මාණකරුවන් ලොව විරල වෙති.
(2) ලේඛකයෝ හෙවත් ගත්කතුවරුන් සම්මාන ලබති.
(3) ගුරුවරු හෙවත් අප යහමඟ යවන්නෝ අපගේ ගෞරවයට පාත්‍ර වෙති.
(4) නිවසට පැමිණ සිටින්නෝ හෙවත් අසල්වැසියන් නිතර අපට උදව් කරති.

29. (1) ක්‍රීඩකයෝ සිවුදෙනෙක් ජාත්‍යන්තර ක්‍රීඩා තරගාවලියට ඉදිරිපත් වූහ.
(2) ශිෂ්‍යයෝ දසදෙනකු විභාගයෙන් ඉහළින් සමත් වූහ.
(3) සාමාජිකයින් දෙදෙනකු රැස්වීමට නොගියහ.
(4) වෛද්‍යවරුන් බොහෝ දෙනකු වෛද්‍ය සායනයට සහභාගි වූහ.

30. (1) ඇත් පෙළ ගම් වැදී හේන් විනාශ කරයි.
(2) සුළඟ නිසා ගස් පෙළ එහෙ මෙහෙ සෙලවෙයි.
(3) හිරු බසිත් ම සියොත් කැල කැදලි කරා පියඹා යයි.
(4) වර්ණවත් කොඩි පෙළ අහසේ සොඳුරු දසුනක් මවති.

31. කවියක අකුරක් හෝ ශබ්දයක් හෝ එක ළඟ නැවත නැවත යෙදීම හඳුන්වන්නේ,
(1) අනුප්‍රාසය යනුවෙනි.
(2) උත්ප්‍රාසය යනුවෙනි.
(3) ධ්වනිතාර්ථය යනුවෙනි.
(4) අතිශයෝක්තිය යනුවෙනි.

32. උපමාවක් සහිත කවි පදයක් තෝරන්න.
(1) රැගත් සුරා පිරූ විතින්
(2) සුරත් තඹුරු පෙති සෙ නෙතින්
(3) පුවත් නොදැන බමන ගතින්
(4) නටත් අයෙක් සුරා මතින්

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

- අංක 33 සිට 35 තෙක් ඇති ප්‍රශ්නවල මුලින් ඉදිරිපත් කර ඇති පාඨ සඳහා **වඩාත් සමීප අර්ථය** දෙන වරණය තෝරන්න.

33. තම කෘෂි කටයුතු සඳහා මහෝපකාරී වූ සූර්යයාට කෘතගුණ සලකනු වස් හින්දූන් විසින් වාර්ෂිකව තෛපොංගල් උත්සවය පවත්වනු ලබයි.
   (1) හින්දූන් විසින් තෛපොංගල් උත්සවය පවත්වනු ලබන්නේ තම කෘෂිකාර්මික කටයුතුවලට උදවු වූ සූර්යයාට කෘතගුණ සැලකීමට ය.
   (2) හින්දූන් තම කෘෂිකාර්මික කටයුතුවලට උදවු වුණු සූර්යයාට කෘතගුණ සලකන්නේ තෛපොංගල් උත්සවය පැවැත්වීමෙනි.
   (3) වර්ෂයක් පාසා තෛපොංගල් උත්සවය පැවැත්වීමෙන් හින්දූන් අපේක්ෂා කරන්නේ සූර්යයාට කෘතගුණ සැලකීමයි.
   (4) තෛපොංගල් උත්සවය වාර්ෂික ව පැවැත්වීමෙන් හින්දූහු තම කෘෂිකාර්මික කටයුතුවලට උපකාර කළ සූර්යයාට කළගුණ සලකති.

34. පාරිභෝගික වැවිල්ලක් වශයෙන් වගා කළ පොල්, ඉංග්‍රීසි යුගයේ දී ඉංග්‍රීසි ජාතිකයන් මෙරට වතු වගා ව්‍යාපාරය ඇරඹීමත් සමඟ ව්‍යාපාරික වැවිල්ලක් බවට පත් විය.
   (1) පරිභෝජනය සඳහා වගා කළ පොල්, ඉංග්‍රීසි යුගයේ දී ඉංග්‍රීසින් විසින් වතු වගා ඇරඹීමත් සමඟ මෙරට ව්‍යාපාරික වැවිල්ලක් බවට පත් විය.
   (2) ඉංග්‍රීසි ජාතිකයන් වතු වගා ව්‍යාපාරය ඇරඹීමත් සමඟ පොල්, විශාල වතුවල වවන්නට පටන් ගැනිණ.
   (3) පරිභෝජනය සඳහා වගා කළ පොල්, ව්‍යාපාරික වශයෙන් වවන්නට පටන් ගත්තේ ඉංග්‍රීසි ජාතිකයන්ගේ පැමිණීමත් සමඟ ය.
   (4) පරිභෝජනය සඳහා වගා කළ පොල්, ඉංග්‍රීසි ආණ්ඩු සමයේ දී වතු වගා සඳහා යොදා ගැනිණි.

35. කුඩා කණ්ඩායම් ලෙස සැදී ගමන් කිරීමට මහත් අභිරුචියක් දක්වන විම්පන්සිහු රාත්‍රි කාලය ගත කිරීම සඳහා උස් ගස්වල මුදුන් නවා නිදියහන් සාදා ගනිති.
   (1) විම්පන්සිහු කුඩා කණ්ඩායම් වශයෙන් ගමන් කිරීමට කැමති වන අතර ගස්වල මුදුන් අතු නවා නිදි යහන් සාදා ගනිති.
   (2) කුඩා කණ්ඩායම් වශයෙන් ගමන් කරන විම්පන්සිහු උස් ගස්වල අතු මුදුන් නවා නිදා ගැනීමේ රුසියෝ ය.
   (3) විම්පන්සින් කණ්ඩායම් වශයෙන් ගමන් කිරීමට කැමති අතර රාත්‍රි කාලය ගත කිරීමට නිදි යහන් සාදා ගන්නේ උස් ගස්වල මුදුන් අතු නවා ගැනීමෙනි.
   (4) කුඩා කණ්ඩායම් වශයෙන් ගමන් කිරීමට කැමැත්තක් දක්වන විම්පන්සිහු උස් ගස්වල මුදුන් නවා සකස් කර ගත් නිදි යහන්වල රාත්‍රිය ගත කරති.

36. 'කාව්‍යශේඛරය ලිව්වේ කෝට්ටේ යුගයේ හිටපු ශ්‍රේෂ්ඨ කවියෙක් වුණු ශ්‍රී රාහුල හාමුදුරුවෝ' යන වාක්‍යය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට **වඩාත් නිවැරදි වාක්‍යය** සහිත වරණය තෝරන්න.
   (1) කෝට්ටේ යුගයේ විසූ ශ්‍රේෂ්ඨ කවියකු වූ ශ්‍රී රාහුල හිමියෝ කාව්‍යශේඛරය ලියා ඇත.
   (2) කාව්‍යශේඛරය ලියන ලද්දේ කෝට්ටේ යුගයේ විසූ ශ්‍රේෂ්ඨ කවියකු වූ ශ්‍රී රාහුල හිමියන් විසිනි.
   (3) කෝට්ටේ යුගයේ විසූ ශ්‍රේෂ්ඨ කවියකු වූ ශ්‍රී රාහුල හිමියන් කාව්‍යශේඛරය ලියන ලදී.
   (4) කාව්‍යශේඛරය කෝට්ටේ යුගයේ විසූ ශ්‍රේෂ්ඨ කවියකු වූ ශ්‍රී රාහුල හිමියන් ලියන ලද්දකි.

37. තරුණියකට අත්කිසිවකින් නොලද හැකි ජපා වර්ණයෙන් මේ කාන්තාව අගතැන්පත් ය. යන වාක්‍යයේ **ජපා වර්ණය** යනු,
   (1) රතු පැහැයයි. (2) තැඹිලි පැහැයයි.
   (3) කළු පැහැයයි. (4) රෝස පැහැයයි.

38. පිදුරු සඳහා කමත් ව්‍යවහාරයේ දී යෙදෙන වචනය වන්නේ,
   (1) යතුර යන්නයි. (2) මැඩුවම් යන්නයි.
   (3) ඇඹුල යන්නයි. (4) උප්පිඩ යන්නයි.

39. "ඉසිරී දිසි දිය දහරින් අඹරා
සසිරි හුනු ඉඳු සැව් සිය පතරා" යන පද්‍යාර්ධයෙහි **වඩාත් නිවැරදි** අදහස තෝරන්න.
   (1) ජල ක්‍රීඩාව නිසා අහසෙහි විසිරී පෙනුණු දියදහරාවලින් මතු වී දේදුනු සිය ගණනක් දිස්වෙයි.
   (2) ජල ක්‍රීඩාවෙන් විසිරී පෙනුණු දිය දහරා නිසා අහසේ දේදුනු සිය ගණනක් මෙන් පෙනෙන්නට විය.
   (3) ජල ක්‍රීඩාව නිසා මතු වුණු ජල ධාරාවලින් සෑදුණු දේදුනු සිය ගණනකි.
   (4) දේදුනු පෙනෙන්නට වූයේ ජල ක්‍රීඩාවෙන් විසිරුණු ජලය නිසා ය.

40. වෙස්සන්තර ගීතාංක නාටකය රචනා කරන ලද්දේ,
   (1) දයානන්ද ගුණවර්ධන මහතා විසිනි. (2) ගරු මර්සිලින් ජයකොඩි පියතුමා විසිනි.
   (3) එදිරිවීර සරච්චන්ද්‍ර මහතා විසිනි. (4) කේ. ජයතිලක මහතා විසිනි.

* *



WWW.OLEVELAPI.COM
අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

WWW.OLEVELAPI.COM

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2014
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2014

| විෂයය අංකය / பாட இலக்கம் | 21 | විෂයය / பாடம் | සිංහල භාෂාව හා සාහිත්‍යය |
|---|---|---|---|

## I පත්‍රය - පිළිතුරු

## I பத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. | ප්‍රශ්න අංකය / வினா இல. | පිළිතුරු අංකය / விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 2 | 11. | 2 | 21. | 1 | 31. | 1 |
| 02. | 1 | 12. | 4 | 22. | 4 | 32. | 2 |
| 03. | 3 | 13. | 1 | 23. | 1 | 33. | 4 |
| 04. | 4 | 14. | 3 | 24. | 3 | 34. | 1 |
| 05. | 2 | 15. | 1 | 25. | 2 | 35. | 4 |
| 06. | 4 | 16. | 4 | 26. | 2 | 36. | 2 |
| 07. | 2 | 17. | 2 | 27. | 4 | 37. | 4 |
| 08. | 1 | 18. | 3 | 28. | 3 | 38. | 2 |
| 09. | 2 | 19. | 1 | 29. | 1 | 39. | 1 |
| 10. | 4 | 20. | 4 | 30. | 2 | 40. | 3 |

WWW.OLEVELAPI.COM

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු **01** බැගින් / ஒரு சரியான விடைக்கு **01** புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

---

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තර පත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள் | |
|---|---|---|---|
| | 40 | | 40 |



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ...

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
# II පත්‍රය

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය - භාෂා පරිචය ඇගයීම**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. අනු ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ** නම් එහි **අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) සිංහල අක්ෂර මාලාවෙහි ඇතුළත් තාලුජ අක්ෂර **දෙකක්** ද මහාප්‍රාණ අක්ෂර **දෙකක්** ද ලියා දක්වන්න.

(ii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් තද්ධිත පද **දෙක** නම් කරන්න.
සමාධි බුද්ධ ප්‍රතිමාව මෙරට ශෛලමය ප්‍රතිමා අතර අනගිතම නිර්මාණය බව කලා විචාරකයෝ පවසති.

(iii) පහත සඳහන් පද **දෙකෙහි** විරුද්ධාර්ථ රූප ලියන්න.
**(අ)** අභිමුඛ **(ආ)** ප්‍රතිභාපූර්ණ

(iv) පහත සඳහන් **(අ)** සහ **(ආ)** වාක්‍යවල යෙදී ඇති **සවන** යන්නට තේරුම් දෙකකි. ඒ **තේරුම් දෙක** ලියා දක්වන්න.
**(අ)** **සවන** පිනවන ඒ මියුරු ගීතය පිළිබඳ ව බොහෝ දෙනෙක් ප්‍රසාදය පළ කළහ.
**(ආ)** පැරකුම්බා සිරිත **සවන** පරාක්‍රමබාහු රජතුමා වර්ණනා කිරීම සඳහා රචනා වූ ග්‍රන්ථයකි.

(v) පහත සඳහන් වාක්‍යයෙහි පවතින සදොස් වචන **දෙක** හඳුනාගෙන ඒ වචන **දෙක** පමණක් නිදොස් කොට ලියන්න.
"ඇමෙරිකාවේ හටගත් ලැව්ගින්නකින් වනාන්තරයක් ඇවි අලු වී ගිය බව පුවත්පත් වාර්තාවක පළ වී තිබිණි."

(vi) මෙහි **(අ)** සහ **(ආ)** කොටස්වල එන කර්මකාරක වාක්‍ය **දෙක** කර්තෘකාරකයට හරවා ලියන්න.
**(අ)** උවැසිය විසින් විහාරයෙහි දී ප්‍රාර්ථනයක් කරන ලදි.
**(ආ)** අතීත රජවරුන් විසින් මහා වැව් සැදිණි.

(vii) පහත සඳහන් වාක්‍ය **දෙකෙහි** සදොස් තැන් ඇතොත් නිදොස් කරන්න.
**(අ)** සොරු කැලෑවේ සැඟවී සිටිති'යි පොලිසිය සැක කරයි.
**(ආ)** ලේඛකයෙක් වූ ඔහු දක්ෂ ගායකයෙක් ද විය.

(viii) පහත සඳහන් **(අ)** සහ **(ආ)** කොටස්වල එන වාක්‍ය **දෙකෙහි** ඇතුළත් උපසර්ග **දෙක** ලියා දක්වන්න.
**(අ)** ලාංකේය සූපවේදීන්ගේ මිහිරි ආහාරපාන විදේශිකයන්ගේ පැසසුමට පාත්‍ර විය.
**(ආ)** යහපත් ක්‍රියාවන්හි යෙදීම මෙන් ම දුසිරිතෙන් වැළකීම ද ශිෂ්ට සම්පන්න සමාජයක් බිහි කිරීමෙහි ලා වැදගත් වේ.

(ix) පහත දැක්වෙන විසන්ධි පද සන්ධි කොට ලියන්න.
**(අ)** හේතු + උත්පත්ති **(ආ)** ගඟ + වතුර

(x) පහත දැක්වෙන නිපාත පද දෙක වෙන් වෙන් ව යොදා නිවැරදි උක්තාඛ්‍යාතය සහිත කෙටි වාක්‍ය **දෙකක්** නිර්මාණය කරන්න.
**(අ)** සහ **(ආ)** මෙන් (ලකුණු 20 යි.)

i. තාලුජ - ඉ, ඊ, ච, ඡ, ජ, ඣ, ඤ, ශ, ය
මහාප්‍රාණ - ඛ, ඡ, ඨ, ථ, ඵ, ඝ, ඣ, ඪ, ධ, භ

තාලුජ හා මහාප්‍රාණ අකුරු දෙක බැගින් ලියා ඇතොත් ලකුණු දෙකයි. තාලුජ හා මහාප්‍රාණ එක අකුර බැගින් ලියා ඇතොත් එක ලකුණක් දෙන්න.

WWW.OLEVELAPI.COM

ii. ශෛලමය , අනගිතම

iii. (අ) අනභිමුඛ
(ආ) ප්‍රතිභාහීන

iv. (අ) කන, කර්ණ, කන්
(ආ) හයවන

v. ලැව්ගින්නක්
අළු



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

vi. (අ) උවැසිය විහාරයේ දී ප්‍රාර්ථනයක් කළාය.
(ආ) අතීත රජවරු මහා වැව් සෑදූහ / සෑදූවෝය / සෑදූ / සෑදූය.

vii (අ) සොරුන් කැලෑවේ සැඟවී සිටිති'යි පොලීසිය සැක කරයි.
(ආ) ලේඛකයකු වූ ඔහු දක්ෂ ගායකයෙක්ද විය.

viii. (අ) වි (විදේශිකයන්ගේ)
(ආ) දූ (දූසිරිතෙන්)

ix. (අ) හේතුත්පත්ති
(ආ) ගංවතුර

x. (අ) ගොවියෝ සහ කම්කරුවෝ සමඟියෙන් වැඩ කරති.
දෙගුරුන් සහ දරුවෝ නිවසේ වෙසෙති.

(ආ) ගොළුවෙකු මෙන් කතා නොකර සිටින්න.
මෝඩයෙකු මෙන් වැඩ නොකරන්න.

(මෙබඳු ව්‍යාකරණානුකූල නිවැරදි නිදසුන් සහිත වාක්‍ය ඇත්නම් ලකුණු දෙන්න.)

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය - සංශ්ලේෂණ හැකියාව මැනීම**

මේ ප්‍රශ්නය සැකසීමේ දී අනුගමනය කර ඇත්තේ මාර්ගෝපදේශිත රචනා මූලධර්මය යි. එනම් ඉදිරිපත් කොට ඇති මග පෙන්වීම ප්‍රයෝජනයට ගනිමින් කිසියම් රචනාවක් කිරීමට අපේක්ෂකයාට ඉඩ සැලැස්වීම යි. රචනයේ ඇතුළත් විය යුතු කරුණු, විස්තරය ඇසුරින් වටහා ගත යුතුය. රචනයෙහි විය යුතු ඡේද සංඛ්‍යාව ගැන වැටහීමක් දී ඇති විස්තරයෙන් ලබා ගත හැකිය. මාතෘකාව ඉදිරිපත් කොට නැතත්, ඉදිරිපත් කොට ඇති විස්තර ඇසුරින් මාතෘකාව සකස් කර ගැනීමට අපේක්ෂකයාට අවසර ඇත.

2. පහත දැක්වෙන **අ, ආ, ඉ, ඊ** යන විස්තර අතුරෙන් **එකක්** තෝරාගෙන **වචන 250කට නොඅඩු** වන සේ රචනයක් ලියන්න. ඒ සඳහා **යෝග්‍ය මාතෘකාවක්** ද යොදන්න.

(අ) සකසුරුවම සහ ඉතිරි කිරීම පැරණි ශ්‍රී ලාංකිකයන් සතු වූ යහපත් ගුණාංගද්වයකි. වර්තමානයෙහි ජනප්‍රිය සංස්කෘතිය මගින් සමාජය වෙත මුදාහැරෙන බහුභාණ්ඩ හා සේවාවන් පරිභෝජනය කිරීමට සෑම තරාතිරමක ම පුද්ගලයන් දැඩි ඇල්මක් දක්වනු දැකිය හැකි ය. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් පූර්වෝක්ත ගුණාංග අප කෙරෙන් බැහැර වීමේ අවදානමක් මතුව තිබේ. එබැවින් සකසුරුවම හා ඉතිරි කිරීමේ වටිනාකම පිළිබඳ ව පාසල් මට්ටමේ සිට ම ක්‍රමවත් අවබෝධයක් ලබාදීමට පියවර ගැනීම අවශ්‍ය වේ.

(ආ) වර්තමානය වන විට සමස්ත ලෝකය ම පරිගණක තාක්ෂණයට අවනත වී ඇත. එමගින් සෑම ක්ෂේත්‍රයක ම කටයුතු පහසු කෙරෙයි. එහෙත් හුදු පරිගණක තාක්ෂණය කෙරෙහි ම විශ්වාසය තැබීම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල පැන නගින සමාජ, ආර්ථික හා සංස්කෘතික ගැටලු බොහෝ ය. එවැනි තත්ත්ව මගහරවා ගෙන රටේ ප්‍රගමණයට පරිගණක තාක්ෂණය උපයෝගී කර ගැනීමට නම් තිරසාර හා දූරදර්ශී ක්‍රියාමාර්ග අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ.

(ඉ) ස්වකීය ශරීර සෞඛ්‍යයටත් වඩා රූපලාවණ්‍යය කෙරෙහි සැලකිලිමත් වීමට වත්මන් තරුණ තරුණියන් විශේෂාවධානයක් දක්වනු පෙනේ. විශේෂයෙන් ශරීර බර සහ ස්ථූලතාව අඩුකර ගැනීම, සමෙහි පැහැය දීප්තිමත් කර ගැනීම, හිස කෙස් වර්ණ ගැන්වීම වැනි කාර්යයන් සඳහා කෘත්‍රිම රසායනික නිෂ්පාදන වර්ග භාවිත කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතැමුන් ජීවිතක්ෂයට පත් වන අවස්ථා ද තිබේ. තම තමන්ගේ දෛනික ආහාර රටාව පාලනය කර ගැනීමෙන් හා සන්සුන් මනසක් ගොඩනගා ගැනීමෙන් නිරෝග මනහර ශරීරයක් අත්පත් කර ගත හැකි ආකාරය අවධාරණය කෙරෙන අධ්‍යාපනික පාඨමාලා පාසල් විෂයමාලාවට ඇතුළත් කිරීම කාලෝචිත ය.

(ඊ) ශ්‍රී ලංකාව ඇතුළු ආසියාකරයේ රටවල ජීවත්වන වැඩිහිටි ජනගහනය ශීඝ්‍රයෙන් ඉහළ යමින් පවතී. මේ අතර වර්තමානයෙහි සිදුවෙමින් පවතින අඛණ්ඩ ආර්ථික හා සමාජීය පරිවර්තනය, ජීවන වියදම ඉහළ යාම, පවුලේ සාමාජිකයන් ගණන අඩු වීම, නාගරීකරණය වැනි හේතු මත ස්වකීයයන්ගෙන් ඈත්වන වැඩිහිටියන් දිනෙන් දින ම අසරණභාවයට පත්වනු පෙනේ. ප්‍රමිතියකින් තොර වැඩිහිටි නිවාසවල ඔවුන් රඳවා තබනවාට වඩා ආදරයෙන් හා කරුණාවෙන් රැකබලා ගත හැකි ක්‍රමවේදයක් සකස් කිරීම කඩිනම් කළ යුතු ය. (ලකුණු 25 යි)

(අ) • සකසුරුවම හා ඉතිරි කිරීම
• සකසුරුවම හා ඉතිරි කිරීමේ වටිනාකම



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

(ආ) • පරිගණක තාක්ෂණයේ* මනා භාවිතය
• රටේ ප්‍රගමනයට පරිගණක තාක්ෂණය උපයෝගී කරගැනීම

(ඉ) • නීරෝග මනහර ශරීර වර්ධනය පිළිබඳ දැනුම පාසල් විෂය මාලාවට ඇතුළත් කිරීම
• රූප ලාවණ්‍යයට වඩා ස්වකීය ශරීර සෞඛ්‍යය රැකගැනීම

(ඊ) • අපේ වැඩිහිටියන් නිවෙස්වලම රැකබලා ගැනීම
• අපේ වැඩිහිටියන් නිවෙස්වලින් පිටමන් කිරීම නොකළ යුතුයි

**ලකුණු විග්‍රහය - මුළු ලකුණු 25යි**

| | | |
|---|---|---|
| 01. සාරවත්භාවය, මාතෘකාව ද ඇතුළුව | - | ලකුණු 08යි |
| 02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය | - | ලකුණු 12යි |
| 03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම | - | ලකුණු 05යි |

01. සාරවත්භාවය - ලකුණු 07යි
විස්තරයට අදාළ වන පරිදි මාතෘකාවක් යොදා තිබීම - ලකුණු 01යි

තේමාවට අදාළ බව, ඉදිරිපත් කොට ඇති ව්‍යුහයට සමීප බව, සරුබව හා සමබව, වචන ගණන 250 සමීප ව පැවතීම යන කරුණු සාරවත්භාවය යටතේ සැලකිල්ලට ගත යුතු වේ.

02. සංවිධානය, නිර්මාණාත්මකභාවය හා ස්වීයත්වය - ලකුණු 12යි
මෙහි දී උසස් ප්‍රකාශන ශක්තිය, සංවිධානය, ස්වීයත්වය, නිර්මාණාත්මක ප්‍රකාශන, ව්‍යාක්ත ලේඛන ව්‍යාවහාරය ආදී අංශ ගැන සලකා බැලිය යුතුය.

03. ශිල්පීය දක්ෂතා සහ ඡේද බෙදා ලිවීම - ලකුණු 05යි
වියරණ, අත්අකුරු, විරාම ලක්ෂණ භාවිතය, ඡේද අදාළ පරිදි වෙන් කොට තිබීම, පද වෙන් කොට ලිවීම යන අංශ ගැන සලකා බලා ලකුණු තීරණය කළ යුතු වේ.

❖ **සැලකිය යුතුයි**

01. රචනයේ වචන ගණන දළ වශයෙන් 200ට වඩා අඩු වන කල්හි ඉහත දැක්වූ 1, 2, 3 යන කොටස්වලට අනුපාතික ව ලකුණක් තීරණය කළ යුතු වේ.

02. වැදගත් අදහස්, සිත් ගන්නා ප්‍රකාශන ඇති තැන්වල (✓) යොදන්න. වැරදි තැන්වල (×) ලකුණු යොදන්න.

WWW.OLEVELAPI.COM

03. උක්තාඛ්‍යාත සම්බන්ධ වැරදි තැන් යටින් ඉරක් අඳින්න. අක්ෂර වින්‍යාසය වැරදි වචන වටා රවුමක් අඳින්න.
1, 2, 3 යන කොටස් සඳහා දෙන ලද ලකුණු උත්තරය අග හරස් අතට ලියා එකතු කර. මුළු ලකුණු ගණන ලබා ගන්න.

නිදසුන් $\frac{6}{8}$ $\frac{9}{12}$ $\frac{3}{5}$ $\frac{18}{25}$

සංලක්ෂය — වාක්‍ය රචනා ඇගයීමට පෙර අදාළ ව්‍යුහය කියවා දළ සැලැස්මක් සකස් කරගන්න. ව්‍යුහයට කිසිසේත් අදාළ නොවන සේ ලියා ඇති රචනා ඇගයීමේ දී සාරවත්භාවය සඳහා පිරිනැමිය යුත්තේ ඉතා අඩු ලකුණකි.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 03**

**අපේක්ෂණය** - කිසියම් කොටසක් කියවා, විස්තර වර්ණනා බැහැර කරමින්, එහි හරය වටහා ගෙන, ඒ ඇසුරින් සමස්ත අර්ථය තම වචනයෙන් ඉදිරිපත් කිරීමේ හැකියාව මෙහි දී ඇගයේ. එසේ ම සංශ්ලේෂණ මෙන් ම විශ්ලේෂණ හැකියාව ද ඇගයීමට භාජනය කෙරේ.

**3.** **පහත සඳහන් ඡේදය වචන 50 - 60 අතර වන සේ සාරාංශ කොට ලියන්න.** ඔබේ සාරාංශයේ වචන සංඛ්‍යාව උත්තරය අග ලියන්න.

**සාහිත්‍යකරුවා තමාගේ අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කරන්නේ භාෂාව මඟිනි. භාෂාව වූ කලී අදහස් හා හැඟීම් ගෙන යන වාහකයයි. ලේඛකයා තම හදවත කම්පනය කළ අත්දැකීමක් ප්‍රතිනිර්මාණය කරන්නේ වචන අනුසාරයෙනි. සාහිත්‍යය වනාහි භාෂාත්මක වික්‍රමයකි. සාහිත්‍යය භාෂාත්මක වික්‍රමයක් හෙයින් ප්‍රතිභාසම්පන්න ලේඛකයකු සතු ගුණාංගයක් විය යුත්තේ භාෂාධිපත්‍යයයි. තමාට අභිමත පරිදි බස හසුරුවා ගැනීමේ ශක්තියක් ඔහුට තිබිය යුතු ය. ඒ හෙයින් ලේඛකයකුගේ නිපුණතාව බොහෝ දුරට ප්‍රකට වන්නේ ඔහු භාෂාව ස්වකීය කාර්ය සාධනය සඳහා වහල් කොට ගන්නා ආකාරයෙන් බව කිවමනා ය.**

**සාහිත්‍යකරුවා උපයෝගී කොට ගන්නා භාෂා මාධ්‍යයෙහි කිසියම් විශේෂතාවක් ඇත. එම විශේෂත්වය ප්‍රත්‍යක්ෂ කොට ගත හැක්කේ සාහිත්‍යකරුවන්ට අන්‍යතර වූවන් භාෂාව පරිහරණය කරන ආකාරය පරීක්ෂා කිරීමෙනි. සාහිත්‍යයික භාෂාවේ විශේෂත්වය වූ කලී එහි ඇති භාවික ගුණයයි. පාඨකයාගේ භාවයන් ප්‍රබෝධ කොට ඔහු අත්දැකීමට සහභාගී කරවා ගැනීමේ ශක්තියයි. ප්‍රතිභාසම්පන්න ලේඛකයකු අපූර්වත්වයෙන් යුක්ත භාෂාවක් නිර්මාණය කිරීමට අමුතුවෙන් වෙහෙස වන්නේ නැත. එහෙත් සමහරු ඉතා කෘත්‍රිම ආකාරයට එම අපූර්වතාව ඇති කිරීමට වෑයම් කරති. පද්‍යයට ම විශේෂිත වූ වචනමාලාවක් ඇතැයි සමහරු කල්පනා කරති. ඒ නිසා ම බැලූ බැල්මට සුන්දර යැ'යි පෙනෙන වචන ඔවුහු පද්‍යකරණය සඳහා යොදා ගනිති. එහෙත් එබඳු සුන්දර වචන යෙදීමෙන් ම කාව්‍ය භාෂාවේ භාවපූර්ණත්වයක් ඇති නොවේ. කාව්‍ය භාෂාව අත්දැකීම සමඟ අත්‍යන්තයෙන් ම බැඳී පවතින්නක් විය යුතු ය. නිර්මාණාත්මක සාහිත්‍ය කෘතියක් එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීම දුෂ්කර වන්නේ ඒ හෙයිනි.**

(ලකුණු 10 යි)

1. භාෂාවේ වචන මගින් සාහිත්‍යකරුවා තම අත්දැකීම් පාඨකයාට ඉදිරිපත් කිරීම
2. භාෂාධිපත්‍යය ලේඛකයා සතු ගුණාංගයක් බව
3. සාහිත්‍ය භාෂාවෙහි කිසියම් විශේෂත්වයක් දක්නට ලැබීම
4. ප්‍රතිභාසම්පන්න ලේඛකයා පාඨකයා ප්‍රබෝධවත් කරමින් නිර්මාණාත්මක භාෂාව යොදාගැනීම
5. පද්‍යකරණය සඳහා පමණක් විශේෂ ~~බස්වහරක්~~ භාෂා ව්‍යවහාරයක් යෙදීමේ අයෝග්‍යතාව
6. කාව්‍ය භාෂාව අත්දැකීම් සමඟ ~~බැඳී~~ රැඳී පැවතීම හා එබඳු උසස් සාහිත්‍ය කෘතියක් පරිවර්තනයට පවත්නා දුෂ්කරතාව

වචන ගණන 65 ඉක්මවන කල්හි සැලකිය යුත්තේ මුල් වචන 60 තුළ ඇති ප්‍රධාන අදහස් පමණි. වචන 45ට අඩු කල්හි එහි ඇතුළත් අදහස් ගණනය කොට ඊට සුදුසු අනුපාතික ලකුණක් පිරිනමන්න. උත්තරය ඡේදයක් සේ ලියා තිබිය යුතුය. කොටුවක් තුළ පද බෙදා තිබුණ ද පිළිගන්න. එක යට එක අසම්බන්ධිත වාක්‍ය වශයෙන් ලියා ඇත්නම් අන්තර්ගතයට දිය හැකි උපරිම ලකුණු ගණන 02 කි. වචන ගණනයේ දී ලිහිල් පිළිවෙතක් අනුගමනය කරන්න. වචන ගණන දළ වශයෙන් 65ට වැඩි කල්හි හෝ 45ට අඩුවන කල්හි වචන ගණන සඳහා ලකුණු 01 ~~හෝ 02 හෝ~~ පිරිනමන්න.

කරුණු 6/6

වචන 2/6

[illegible] 2/6



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 04**

**අපේක්ෂණය** - ඉදිරිපත් කොට ඇති ඡේදය ඇසුරින් අවබෝධ හැකියාව මැනීම.

4. පහත දැක්වෙන **ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට** උත්තර සපයන්න.

පෙරදිග රටවලට ආවේණික වූ ආයුර්වේද වෛද්‍ය ක්‍රමයට දීර්ඝ ඉතිහාසයක් තිබේ. අනාදිමත් කාලයක සිට මනුෂ්‍යයන්ගේ රෝග සුව කිරීම පිළිබඳ අත්දුටු, ඇතැම්විට ගුප්ත වූ මේ ක්‍රමය දේවභාෂිතයක් ලෙස භාරතීය ඍෂිවරු පරපුරෙන් පරපුරට රැකගෙන ආහ. පැරණි ඍෂිවරුන්ගේ වෛද්‍ය ග්‍රන්ථ සංස්කෘතයෙන් ලියවී තිබුණේ ය. සංස්කෘත සාහිත්‍යය, වෛද්‍ය, ශාස්ත්‍රීය ග්‍රන්ථයන්ගෙන් පෝෂණය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. ලංකාවේ හැම වෛද්‍යවරයකු ම මුල දී වෛද්‍ය ශාස්ත්‍රය හැදෑරුවේ සංස්කෘත ග්‍රන්ථ පරිශීලනයෙනි. එම අධ්‍යාපනයෙහි මුල් පියවර වශයෙන් ඔවුහු සරස්වතී, මහෞෂධ, නිඝණ්ටු ආදී සංස්කෘත වෛද්‍ය ග්‍රන්ථ වනපොත් කළහ. වෛද්‍ය විද්‍යාව දැන සිටීම ඉතා ප්‍රශස්ත යයි මෙරට වැසියන් පැරණි සමයේ දී සැලකූ බව "රජකම බැරිනම් වෙදකම" යන පිරුළින් පැහැදිලි වේ. වෛද්‍ය විද්‍යාව සැම කුලීන සිංහලයකු ම දැන ගත යුතු වූ චතුර් විද්‍යාවෙන් එකකි. පැරණි වෛද්‍යාචාර්යවරුන් වෛද්‍යවේදය හා ශල්‍යකර්මය යන දෙඅංශයෙන් ම නිපුණව සිටි බව ඉතිහාස වාර්තාවල සඳහන් වේ. වෛද්‍ය, ශල්‍ය යන දෙඅංශයෙහි ම දක්ෂ සමහරෙක් පින් පිණිස වෛද්‍ය කර්මයෙහි යෙදුණාහ.

(i) භාරතීය ඍෂිවරුන් විසින් ආයුර්වේද වෛද්‍ය ක්‍රමය පරපුරෙන් පරපුරට රැකගෙන එන ලද්දේ එයට කෙබඳු ආකාරයේ සැලකිල්ලක් දැක්වීමෙන් ද?
(ii) සංස්කෘත සාහිත්‍යය, වෛද්‍ය, ශාස්ත්‍රීය ග්‍රන්ථවලින් පෝෂණය වූයේ කිනම් කරුණක් නිසා ද?
(iii) සෞඛ්‍ය අධ්‍යාපනයෙහි නියැලුණු ලංකාවේ වෛද්‍යවරුන් මුල් පියවරෙහි දී වනපොත් කළ යුතු වූ ග්‍රන්ථ කීයක් මෙහි දැක්වේ ද? ඒ මොනවා ද?
(iv) සැම කුලීන සිංහලයකු ම දැනගත යුතු වූයේ කුමක් ද?
(v) පැරණි වෛද්‍යාචාර්යවරුන් නිපුණව සිටි වෛද්‍ය විද්‍යාවට අයත් ප්‍රධාන අංශ **දෙක** මොනවා ද?

(ලකුණු 10 යි)

i. දේව භාෂිතයක් ලෙස සැලකීමෙන්.

ii. වෛද්‍ය ග්‍රන්ථ සංස්කෘතයෙන් ලියවී තිබූ නිසා.

iii. 3 යි. සරස්වතී, මහෞෂධ, නිඝණ්ටු

iv. චතුර්විද්‍යාව / වෛද්‍ය විද්‍යාව

v. වෛද්‍ය හා ශල්‍ය යන අංශ දෙක

***(එක් නිවැරදි උත්තරයකට ලකුණු 2 බැගින්)***

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 05**

**අපේක්ෂණය** - ප්‍රායෝගික ලේඛන හැකියාව පිළිබඳ අපේක්ෂයා සතු කුසලතා මැනීම

**5.** **පසුගිය දිනවල පැවැති අධික වර්ෂාව හේතුවෙන් හදිසි ගංවතුර තත්ත්වයන්ට මුහුණ දීමට සාරපුර ගම් වැසියන්ට සිදු වී ඇත. ගංවතුරෙන් පසුව පාචනය, කොළරාව, වෛරස් උණ ආදි වසංගත රෝග ශීඝ්‍රයෙන් බෝවෙමින් පවතී. එයට ප්‍රධාන හේතුව ගංවතුර නිසා පානීය ජලය සහිත ළිං අපිරිසිදු වී යාමයි. මේ නිසා උණු කර නිවා ගත් ජලය පානයට ජනතාව යොමු කළ යුතු ය. මේ පිළිබඳ ව ජනතාව දැනුවත් කිරීමට සුදුසු අත් පත්‍රිකාවක් සකස් කරන්න. ප්‍රදේශයේ මහජන සෞඛ්‍ය පරීක්ෂක ඔබ යැ'යි සිතන්න.**

**නැතහොත්**

**වීරගම මාණ්ඩලික වාර්තාකරු දසුන් වීරසිංහ මහතා විසින් ලියන ලද කෙටි සටහනක් පහත දැක්වේ.**

- අවස්ථාව - වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය
- පැවැති ස්ථානය - වීරගම මහා විද්‍යාලය
- දිනය - 2014.03.21 වේලාව ප.ව. 2.00
- විශේෂ ආරාධිත - කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
  - ආදිශිෂ්‍ය ප්‍රවීණ ක්‍රීඩක පසන් ධනුෂ්ක මහතා
- ජයග්‍රාහී නිවාසය - ගජබා
- අමුත්තන්ගේ කතා - 1. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂතුමා
  ක්‍රීඩාව අතින් ප්‍රදේශයේ විශිෂ්ට පාසල වීරගම මහා විද්‍යාලයයි. ක්‍රීඩාව සඳහා අවශ්‍ය පහසුකම් ඉදිරියේ දී ලබා දෙනු ලැබේ.
  - 2. ආදිශිෂ්‍ය පසන් ධනුෂ්ක මහතා
  තම ගමන්මගෙහි සන්ධිස්ථානය මේ පාසලයි. ක්‍රීඩාව සෞඛ්‍යවත් සමාජයකට අඩිතාලම දමයි.

**ඉහත කෙටි සටහන ආශ්‍රයෙන් වීරගම මාණ්ඩලික වාර්තාකරු ඔබ යැ'යි සිතා පුවත්පතක පළ කිරීමට සුදුසු වාර්තාවක් සකස් කරන්න. (මේ සඳහා වචන 100ක් පමණ ප්‍රමාණවත් ය.)** (ලකුණු 15 යි)

**ලකුණු විග්‍රහය -** **මුළු ලකුණු ~~05යි~~** 15යි.

**අත් පත්‍රිකාව**

01. ආකෘතිය සඳහා ලකුණු 04යි
02. අන්තර්ගතය සඳහා ලකුණු 08යි
03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

* අදාළ ආකෘතිය අනුගමනය නොකළ විට කරුණු පමණක් ලියා තිබේනම් අන්තර්ගතය සඳහා නියමිත ලකුණු වලින් ලකුණු 5 කට අඩු අනුපාතික ලකුණක් ප්‍රදානය කරන්න.

**01. ආකෘතිය සඳහා ලකුණු 04යි**

- මාතෘකාව ලකුණු 01 යි.
- සිත්ගන්නාසුලු බව ලකුණු 02 යි.
- සකස්කරන්නාගේ නම ලකුණු 01 යි.

**02. අන්තර්ගතය සඳහා ලකුණු 08යි**

- අධික වර්ෂාව හේතුවෙන් සාරපුර ගම්වැසියන්ට ගංවතුර තත්ත්වයට මුහුණ දීමට සිදුවී ඇති බව.
- ගංවතුරෙන් පසුව පාචනය, කොළරාව, වෛරස් උණ ආදී වසංගත රෝග ශීඝ්‍රයෙන් බෝවෙමින් පවතින බව.
- ඊට හේතුව පානීය ජලය සහිත ළිං අපිරිසිදු වීම.
- උණුකර නිවාගත් ජලය පානය කිරීමට යොමු විය යුතු බව.

***(එක් කරුණකට ලකුණු 02 බැගින් ලකුණු 08 කි)***

**03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.



WWW.OLEVELAPI.COM

අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**පුවත්පත් වාර්තාව - ලකුණු 15යි**

1, 2, 3 යන අංශ සඳහා ලකුණු වෙන් වෙන්ව දී ලකුණු එකතුව ලබාගන්න.

01. ආකෘතිය සඳහා ලකුණු 04යි
02. අන්තර්ගතය සඳහා ලකුණු 08යි
03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි

**01. ආකෘතිය සඳහා ලකුණු 04යි**

- මාතෘකාව ලකුණු 02 යි.
- වාර්තාකරු ලකුණු 01 යි.
- නිර්මාණශීලීබව ලකුණු 01 යි.

**02. අන්තර්ගතය සඳහා ලකුණු 08යි**

- වාර්ෂික නිවාසාන්තර ක්‍රීඩා උත්සවය. *ලකුණු 01යි*
- ස්ථානය - වීරගම මහා විද්‍යාලය *ලකුණු 01යි*
- දිනය හා වේලාව *ලකුණු 01යි*
- ජයග්‍රාහී නිවාසය *ලකුණු 01යි*
- කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ කථාව
  1. වීරගම පාසල ක්‍රීඩාව අතින් විශිෂ්ට පාසලක් බව. *ලකුණු 01යි*
  2. ක්‍රීඩාව දියුණු කිරීමට අවශ්‍ය පහසුකම් ලබා දෙන බව. *ලකුණු 01 යි*
- ආදි ශිෂ්‍ය පසන් ධනුෂ්ක මහතාගේ කතාව
  1. මගේ ගමන් මගෙහි සන්ධිස්ථානය පාසල බව. *ලකුණු 01 යි*
  2. ක්‍රීඩාව සෞඛ්‍යවත් සමාජයකට අඩිතාලම බව. *ලකුණු 01 යි*

**03. ශිල්පීය දක්ෂතා සඳහා ලකුණු 03යි**

නිවැරදි අක්ෂර වින්‍යාසය, උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය, පැහැදිලි අත්අකුරු, නිවැරදි පද බෙදීම, වියරණ, විරාම ලක්ෂණ, ඡේද වෙන්කිරීම සමස්තයක් ලෙස සලකා ලකුණු පිරිනමන්න.

❖ නියමිත වචන ගණන අඩු වන කල්හි හෝ ප්‍රමාණවත් කරුණු හෝ අදාළ කරුණු අන්තර්ගත නොවන අඩුපාඩු සහිත උත්තර ඇති කල්හි අනුපාතික ලකුණුක් දෙන්න.

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

# 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය
## III පත්‍රය

- ❖ **උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න පහකට පමණක් උත්තර සපයන්න.**
- ❖ **1, 2, 3, 4 ප්‍රශ්න වලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් එකකටත් උත්තර සපයන්න.**

**මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80කි.**

මේ පත්‍රයේ දී නිර්දිෂ්ට සාහිත්‍ය පාඨ පිළිබඳව අපේක්ෂකයාගේ අවබෝධය හා රසවින්දන හැකියාව ඇගයීමට භාජනය කෙරේ.

**ප්‍රශ්න අංකය 01**

**අපේක්ෂණය** - නිර්දිෂ්ට ග්‍රන්ථ පරිශීලනය පිළිබඳ පරිචය ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි**

මෙම ප්‍රශ්නයට කෙටි උත්තර අපේක්ෂිත අනුප්‍රශ්න දහයක් ඇතුළත් වේ. එක් අනු ප්‍රශ්නයක එක කොටසකට ලකුණු 01 බැගින් මුළු ලකුණු 20කි.

1. (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. **කිසියම්** අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) "දෙයියම්පා! අනේ අනිච්චං කරුමෙක හැටි. මෙහෙමත් එව්වා මේ ඇස් දෙකෙන් බලන්ඩ සිද්ද උනානේ..."
- (අ) මෙසේ පවසන්නේ කවු ද?
- (ආ) කවුරුන් සම්බන්ධයෙන් ද?

(ii) (අ) 'කිසාගෝතමියක නො වේ' පැදි පෙළ කාගේ නිර්මාණයක් ද?
- (ආ) මේ පැදි පෙළෙහි එන මව ලෝකයෙන් අයදින්නේ කුමක් ද?

(iii) "කියන්න තියන දෙයක් කෙළින් කියාපන් ළමයා"
- (අ) මෙහි ළමයා යනුවෙන් ආමන්ත්‍රණය කරන්නේ කාට ද?
- (ආ) 'කියන්න තියන දේ' කුමක් ද?

(iv) (අ) පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් දඹදෙණි සාහිත්‍ය යුගයේ දී රචනා කෙරුණු ග්‍රන්ථය නම් කරන්න.
- (ආ) හත්ථ හත්ථික සිටාණන් පිළිබඳ පාඩම උපුටා ගෙන ඇත්තේ කුමන කථා වස්තුවකින් ද?

(v) (අ) සිවු පද ආරෙන් කෝට්ටේ යුගයට පෙර රචිත ජාතක කථා කාව්‍යය කුමක් ද?
- (ආ) භික්ෂූන් වහන්සේලා විසින් කවියෙන් බණ කීම ආරම්භ කරන ලද්දේ කිනම් යුගයක දී ද?

(vi) (අ) වේදබ්භ නම් මන්ත්‍රයෙන් ලැබිය හැකි බව කියන ප්‍රතිලාභය කුමක් ද?
- (ආ) වේදබ්භ මන්ත්‍රය පිළිබඳ ව කියැවෙන කථා වස්තුව උපුටාගෙන ඇති ග්‍රන්ථය නම් කරන්න.

(vii) "මහසෙන් රැස්ව කුඩ කොඩි ගෙනවට       කරට
අහසින් ඇවිත් බට තරුවක් දෙරණ       පිට"
- (අ) කවියේ ඉතිරි පද **දෙක** සම්පූර්ණ කරන්න.
- (ආ) තද කළු අකුරෙන් දැක්වෙන වචනයේ අර්ථය ලියන්න.

(viii) (අ) "වසන්ත සමය" පැදි පෙළේ කියැවෙන ජාතික උත්සවය කුමක් ද?
- (ආ) එම පැදි පෙළ රචනා කළ කතුවරයාගේ වෙනත් කෘතියක් නම් කරන්න.

(ix) (අ) වෛද්‍ය ශාස්ත්‍රය ඉගෙනීමට ජීවක ගියේ කිනම් ආචාර්යවරයකු වෙත ද?
- (ආ) ජීවකට සැබෑ ආචාර්යවරයා වූයේ කවරෙක් ද?

(x) (අ) "පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා" කෙටි කතාව උපුටා ගෙන ඇති ග්‍රන්ථය කුමක් ද?
- (ආ) "පොළෝ කුහරයෙන් පැමිණි මිනිසා" කෙටි කතාවට පසුබිම් ව ඇති ඉන්දියානු නගරය නම් කරන්න.

(ලකුණු 02 x 10 = 20 යි)



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

i. (අ) සිරියාවතීගේ මව

(ආ) එන්සෝ / එන්සෝ නැන්දා

ii. (අ) දයාසේන ගුණසිංහ

(ආ) මියෙන පොඩි පුතු රකින මගක්

iii. (අ) ලව්නේරිස්ට /

(ආ) නන්දාවතී පිළිබඳ විවාහ යෝජනාව

iv. (අ) සද්ධර්මරත්නාවලිය

(ආ) සුබ සාමණේර වස්තුව

v. (අ) සඳ කිඳුරුදා කව

(ආ) කුරුණෑගල යුගය

vi. (අ) සත්රුවන් වැසි වැස්සවීම

(ආ) (පන්සිය පනස්) ජාතක පොත

vii. (අ) විගසින් ඇහිඳ ගත්තෙමි අමයුරු ලෙසට
සීනෙන් තරුව ගිලුණා මගෙ ගැබ තුළට

(ආ) බැස්ස වූ /වැටුණු / බැස / පහතට වැටුණු / පතිත වූ / බැස්ස

viii. (අ) අලුත් අවුරුදු උත්සවය (සිංහල හින්දු)

(ආ) ගඟේ ගිය මිණ, රස දහර, බෝ පුද, සෙත් වතුර, කවි මග, සමරු ගීය

ix. (අ) දිසාපාමොක්

(ආ) ශක්‍ර දෙවියා / සක් දෙවිඳු / ශක්‍ර දෙවිඳු / ශක්‍ර දේවේන්ද්‍ර / සක්රජ

x. (අ) කාබුලිවාලා සහ වෙනත් කතා

(ආ) රාවල්පිණ්ඩි

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 02**

**අපේක්ෂණය** - 1. නිර්දිෂ්ට පාඨ පිළිබඳ අවබෝධය

2. පාඨයක අදහස තම බසින් ලියා දැක්වීමේ කුසලතාව ඇගයීම

**ලකුණු විග්‍රහය** - **මුළු ලකුණු 20යි (එක් කොටසකට ලකුණු 05 බැගින්)**

තද කළු අකුරින් ඇති එක් එක් වචනයට නිවැරදි තේරුම ලියා ඇත්නම් එක

වචනයකට ලකුණු 01 බැගින් - ලකුණු 02යි

සමස්ත අර්ථයට - ලකුණු 03යි

**2.** **පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨවල තද කළු අකුරෙන් මුද්‍රිත කොටස්වල අර්ථය වෙන් වෙන් ව ලියන්න. ඉන් පසු මුළු කොටසේ ම අර්ථය ලිහිල් බසින් ලියන්න.**

(i) "මේ ආවේ ඔබගේ **දුහිතෘ** වන නන්දාවතී චන්ද්‍රසේකර මාගේ **ප්‍රියම්බිකාව** කරගන්න අහන්නයි."

(ii) "මාගේ හිසරුජා **අන්තර්ධාන** විය. මීට පෙර දවස් මෙන් ඉස **ලඝු** විය."

(iii) "උපායක් නැතිව **නිෂ්කාරණයෙහි** තමන්ට **අභිවෘද්ධියක්** ප්‍රාර්ථනා කරන්නා වූ සත්ත්වයෝ ආචාරීන් මෙන් මහත් විනාශයට පැමිණෙති."

(iv) "උසේ කුළින් කුළ බැස නැඟෙමින් **මෙවලා**
තොසේ වඩා **කෙළිමින්** ඇවිද පෙර කලා
මෙසේ වියෝ දුක් උසුලන්ට වූ කලා
කෙසේ තිබේ දෝ හිමි සඳිනි පණ තලා"

(ලකුණු 05 x 04 = 20 යි)

**අපේක්ෂිත උත්තර**

i. (අ) දුහිතෘ - දුව / දියණිය / දුවණිය

ප්‍රියම්බිකාව - ප්‍රිය භාර්යාව / ආදරණීය බිරිඳ

ඔබගේ දුවණිය වන නන්දාවතී මගේ ආදරණීය භාර්යාව කරගැනීමටයි මෙසේ පැමිණියේ.

ii. (අ) අන්තර්ධාන - අතුරුදන් විය / නැතිවී ගියා / සුව විය / නොපෙනී ගියා / සනීප විය.

ලඝු - සැහැල්ලු / බර අඩුවීම.

මගේ ඉසේ කැක්කුම නැතිවී ගියේ ය. මීට පෙර දවස්වල මෙන් ඔළුව සැහැල්ලු විය.

WWW.OLEVELAPI.COM

iii. නිෂ්කාරණයෙහි - හේතුවක් නැතිව / නිකරුණේ / කරුණක් නොමැතිව.

අභිවෘද්ධියක් - දියුණුවක් / යහපතක්

උපාය මාර්ගයක් නොමැතිව හේතු රහිතව තමන්ට දියුණුවක් පතන්නා වූ සත්ත්වයෝ ගුරුවරයා වගේ ලොකු විනාශයකට පැමිණෙති.

iv. මෙවලා - මේ වනයේ / මේ කැලෑවේ / මේ වනාන්තරයේ

කෙළිමින් - ක්‍රීඩා කරමින් / සෙල්ලම් කරමින්

මේ වනාන්තරයේ උස් වූ කඳුවලින් කඳුවලට බැස නගිමින්, සතුට වඩමින් සිටි අපට මේ අයුරින් වියෝග දුකක් දරන්නට වූ කල්හි පණ කෙන්ද / ප්‍රාණ වායුව හිමි සඳිනි. කෙසේ නම් පවතී ද?



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 03**

**ප්‍රශ්න අංක 03 - 07 තෙක්**

**අපේක්ෂණය** - ඇගයීම, ප්‍රකාශනය, භාවිත හැකියාව, විචාර හැකියාව හා රසවින්දන හැකියාව ඇගයීමට ලක් කිරීම

**ලකුණු විග්‍රහය** - 3, 4 ප්‍රශ්න අනිවාර්ය යි. - **ලකුණු 15යි**

5, 6, 7 ප්‍රශ්නවලින් එකක් පමණක් තෝරා ගත යුතුයි. - **ලකුණු 10යි**

3, 4 ප්‍රශ්නවල තෝරාගත් ප්‍රශ්නයේ (i) හා (ii) කොටස් වෙන් වෙන්ව විස්තර සහිතව ලියා තිබිය යුතු ය. උදාහරණ දක්වමින් එක් පිළිතුරක් සේ ලියා තිබුණ ද ලකුණු දෙන්න.

| | | | |
|---|---|---|---|
| උදාහරණ 04ට | - | ලකුණු 04යි | ලකුණු 15 යි |
| සමස්ත විස්තරයට | - | ලකුණු 11යි | |

❖ **3, 4 යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන 125ක් පමණ තිබීම සෑහේ.**

- **3, 4** යන ප්‍රශ්න සඳහා වන උත්තරයක වචන **125ක්** පමණ තිබීම සෑහේ.

**3.** **(i) කුතුහලජනක අවස්ථා ගොඩ නැගීම හා**

**(ii) චරිතවලට උචිත භාෂා භාවිතය**

**මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ සාර්ථකත්වයට ඉවහල් වී ඇති ආකාරය එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වමින් විමසන්න.** (ලකුණු 15 යි)

**නැතහොත්**

**පහත තේමා යටතේ එක් තේමාවකට නිදර්ශන දෙක බැගින් සපයමින් 'කිසාගෝතමියක නො වේ' පැදි පෙළ පිළිබඳ ව ඔබේ අදහස් දක්වන්න.**

**(i) සමාජ අසාධාරණය සංයමයෙන් නිරූපණය කිරීම**

**(ii) අත්දැකීම් නිරූපණයට භාවිත කර ඇති කාව්‍ය උපක්‍රම** (ලකුණු 15 යි)

**අපේක්ෂිත උත්තර**

කුතුහල ජනක අවස්ථා ගොඩනැගීම හා උචිත භාෂා භාවිතය මඟුල් ප්‍රස්තාව නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වේ. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දැක්වීම අපේක්ෂිත ය.

i.
1. ලව්නේරිස් තෙපානිස් හමු වූ අවස්ථාව.
2. නන්දාවතී ලව්නේරිස් හමුවන අවස්ථාව.
3. ගෝනහේන අයිතිය පිළිබඳ ගැටුම.
4. හඳයා හා වල්ලියා අතර ගැටුම.
5. ලව්නේරිස් යාමට සැරසෙන අවස්ථාව.
6. ලව්නේරිස් අසනීප වන අවස්ථාව.

ii. නාට්‍යයෙහි ඒ ඒ චරිත අයත් සමාජ ප්‍රස්තරය, දූන උගත්කම හා ගති ලක්ෂණ මෙන්ම අවස්ථා, හැඟීම් නිරූපණය වන ආකාරයෙන් භාෂාව භාවිත කිරීම. (නූගත්කම, සමාජ ප්‍රස්තරය ආදී)

*උදාහරණ සඳහා ලකුණු 04යි*
*සමස්ත විස්තරයට ලකුණු 11යි*
*මුළු ලකුණු 15යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

නැතහොත්

**අපේක්ෂිත උත්තර**

"කිසාගෝතමියක නොවේ" පැදි පෙළෙහි සමාජ අසාධාරණය සංයමයෙන් නිරූපණය කිරීම හා අත්දැකීම් නිරූපණයට භාවිත කර ඇති උපක්‍රම මෙහිදී පැහැදිලි කළ යුතු ය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දැක්වීම අපේක්ෂා කෙරේ.

I. සමාජ අසාධාරණය සංයමයෙන් නිරූපණය කිරීම.

මෙහිදී සමාජයේ එක් පක්ෂයක් දුක්බරව ජීවත්වන අතර තවත් පිරිසක් මහත් සතුටින් හා ආගමික සිසිකමින් ජීවත්වන ආකාරය සංසන්දනාත්මකව දැක්වීම පැහැදිලි විය යුතු ය. මෙහි අසරණ කාන්තාව ගැන ලියවුණු කවි තුළින් පෙනෙන්නේ සමාජයේ අසාධාරණත්වයයි. අනික් කවි දෙක තුළින් මෙබඳු අසරණයන් ගැන කිසිදු තැකීමක් නොමැතිව කල්ගෙවන මිනිසුන් ගැන තොරතුරු දැක්වේ.

උදාහරණ -

1. වීදි සරණා මවක දුටුවෙමි.

   දෑස කඳුළින් තෙමී අද වුණ.

2. රැයෙහි මැදියම ගෙවෙන මොහොතේණි

   දනන් කෙළිලොල් හඬ නිමාවිය.

හැදෙන වෙනත් උදාහරණද ගත හැක.

II. අත්දැකීම් නිරූපණයට භාවිත කර ඇති කාව්‍ය උපක්‍රම

අසරණ ගැහැනිය මහමග සිඟාකමින් පුතු රැකීමට අනුන්ගේ පිහිට පැතුවත් ඔහු මිය යන ආකාරය දැක්වීමත් මේ ගැන කිසිත් නොසලකා ආගමික භක්තියෙන් හා කෙළිලොල් බවින් යුක්තව ජීවත්වීමට උත්සාහ දරන සමාජය ගැන තියුණු ලෙස කරුණු දැක්වීම ගත හැකි ය.

ධ්වනිතාර්ථ නැගෙන බස්වහර මෙහිදී වැදගත් ය.

"දෑස කඳුලින් තෙමී අඳවුණු"

ඇගේ ළමැදෙහි ගුළිව නිහඬව

"මියැදි බිළිඳුට නැවත පණ නොව"

මියෙන පොඩි පුතු රකින මගකිය

වැනි යෙදුම්වලින් කාන්තාවගේ දුක්ඛිත ස්වරූපය මතු කරයි.

"උවැසි උවැසිය ගැයූ බැති ගී"

අරම පිස වා ගැබට එක් විය.

"නැගෙන සැණකෙළි හඬින් සිව්දෙස"

පිරි අබිසෙස් ලැගී සොම්නස

වැනි යෙදුම්වලින් ඇතැමුන් ගතකරන සුඛිත මුදිත ජීවිතයත්, සමාජයේ අසරණයන් ගැන ඔවුන් නොසලකන ආකාරයත් ධ්වනිත කරයි. මේ අනුව ධ්වනිතාර්ථවත් බස්වහරක් යොදාගෙන ඇත.

යෝග්‍ය කවි සංකල්ප භාවිතය තවත් උපක්‍රමයකි.

එසේම කාන්තාවගේ අසරණ බව නිරූපණය වන සේ විරිතක් යොදාගැනීම මෙහිදී වැදගත් වෙයි.

යෝග්‍ය උපමා හා රූපක භාවිතය.

උදාහරණ - කිසාගෝතමියක ලෙසින්

*උදාහරණ සඳහා ලකුණු 04යි*
*සමස්ත විස්තරයට ලකුණු 11යි*
*මුළු ලකුණු 15යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## ප්‍රශ්න අංකය 04

**4.** (i) උපහාසය දැනවීමට හා

(ii) සජීවී ලෙස චරිත නිරූපණයට තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් භාෂාව භාවිත කළ ආකාරය කාව්‍යශේඛරයේ නිර්දිෂ්ට කොටසෙන් නිදර්ශන **දෙක** බැගින් දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

**නැතහොත්**

'ජීවක කථා වස්තුව',

(i) හොඳින් ඉගෙනීමේ වැදගත්කම හා

(ii) යහපත් ගුණාංග වර්ධනය කර ගැනීම, අගය කරන නිර්මාණයකි.
එක් කරුණකට නිදසුන් **දෙක** බැගින් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 15 යි)

## අපේක්ෂිත උත්තර

උපහාසය දැනවීම හා සජීවී ලෙස චරිත නිරූපණය සඳහා රහල් හිමියන් භාෂාව භාවිතා කළ ආකාරය මෙහිදී පැහැදිලි කළ යුතු ය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් තිබීම අපේක්ෂිත ය.

i. උපහාසය දැනවීම

මෙහිදී මහලු බමුණාගේ චරිතය උපහාසයට ලක්කර ඇත.

උදාහරණ -

නොලදත් ඒ දහස

සිදු වූ සෙයින් අදහස

මෙහිදී මහල්ලා තුළ ඇතිවන ස්ත්‍රී ලෝලත්වය හෙළිවෙයි. බමුණු කුලයේ අයගේ අසරණ බව හා ඔවුන්ගේ හැසිරීම ද මෙහිදී ඉදිරිපත් වෙයි.

උදාහරණ -

"වැඳ කන්නලව් ලෙස

කියත් බමුණත් බැමිණි මේ ලෙස

"දක්වාලා ඔහුට අත්පා මෙහෙ කිරීමට"

ii. සජීවී ලෙස චරිත නිරූපණය

මෙහිදී මහලු බමුණා, දිළිඳු බමුණා හා බැමිණිය යන තිදෙනාගේ චරිත සජීවී ලෙස නිරූපණය වේ. බමුණා හා බැමිණියගේ අසරණ බව හා හැසිරීම සිත්ගන්නා ලෙස දක්වෙයි.

"දක්වාලා ඔහුට.......

WWW.OLEVELAPI.COM

"පෙර අප දැන හැඳින"

"ණය කවුරු දන්දෙති"

අත්පා මෙහෙ කිරීම වැනි තැන් නිදසුන් කොට ගත හැකි ය.

තරුණ බැමිණියගේ රූපශ්‍රීය ද මෙහිදී නිරූපණය වෙයි.

උදාහරණ -

"වතින් සොමි සඳ වූ........

*උදාහරණ සඳහා ලකුණු 04යි*
*සමස්ත විස්තරයට ලකුණු 11යි*
*මුළු ලකුණු 15යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

*නැතහොත්*

**අපේක්ෂිත උත්තර**

හොඳින් ඉගෙනීමේ වැදගත්කම හා යහපත් ගුණාංග වර්ධනය කරගැනීම අගය කරන නිර්මාණයක් ලෙස ජීවක කතා වස්තුව පිළිබඳව කරුණු දක්වීම මෙහිදී අපේක්ෂිත ය. එක් කරුණකට නිදසුන් දෙක බැගින් දක්වීම අවශ්‍ය වේ.

i. හොඳින් ඉගෙනීමේ වැදගත්කම

- ගුරුවරයාගේ ආදරයට හා ප්‍රශංසාවට පාත්‍ර වීම.
- නිරවද්‍ය ලෙස දක්ෂ අන්දමින් තම වෘත්තියේ යෙදීමට නිපුණත්වය ලබාගැනීම.
- යස ඉසුරු, මිල මුදල්, ධන ධාන්‍ය ආදී **සම්පත් ලැබීම.**
- සමාජයේ කාගේත් පිළිගැනීමට පාත්‍ර වීම.

ii. යහපත් ගුණාංග වර්ධනය කරගැනීම

- ගුරු ගෞරවය වර්ධනය කරගැනීම.
- මිල මුදලට යට නොවීම.
- කාරුණිකත්වය.
- මනා අධිෂ්ඨාන ශක්තියක් හා ආත්ම විශ්වාසයක් ඇති කරගැනීම.
- සකසුරුවම් බව.

බිම වැටුණු තෙල් පුළුනෙන් ඉද රැකගන්නා ලෙස සාකේත නුවර සිටු දේවිය කී අවස්ථාව.

- පොරොන්දු ඉටු කිරීම.
    - ජීවකගේ චරිතය තුළින් හා
    - කතාවේ එන වෙනත් චරිත තුළින් නිදසුන් දක්විය හැකි ය.
- තමාට නොගැළපෙන දේ නොගැනීම.
    - ජීවක, බිසෝවරුන්ගේ ආභරණ ලබානොගැනීම.

***උදාහරණ සඳහා ලකුණු 04යි***
***සමස්ත විස්තරයට ලකුණු 11යි***
***මුළු ලකුණු 15යි***

WWW.OLEVELAPI.COM

* 3 සහ 7 ප්‍රශ්නවලදී ගැළපෙන පිළිතුරු ඇත්නම් ලකුණු ප්‍රදානය කරන්න.



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

## ප්‍රශ්න අංකය 05

- **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න. උත්තරයක වචන **100**ක් පමණ තිබීම සෑහේ.

5. **'කිඳුරු වළප' නිර්මාණයේ ශබ්දාලංකාර භාවිතය පිළිබඳ ව නිදසුන් තුනක් දක්වමින් ඇගයීමක් කරන්න.** (ලකුණු 10 යි)

## අපේක්ෂිත උත්තර

❖ එළිසමය
- නිර්දිෂ්ට කවි පන්තියේ සෑම කවියක ම ආරම්භයේ හා අවසානයේ එළිසමය යොදා ඇති බැවින් ඕනෑම කවියක් නිදසුන් ලෙස ගත හැකි ය.

❖ ශබ්දධ්වනි භාවිතය
- සිප බඳ, සැප විඳ, .........
- පොවා පියා, පිනා පියා
- ගඟුලැල්ලේය, සිහිලැල්ලේයා ............
- සුද්දේ, බැද්දේ .........
- සුපුල්වන, එකල් වන......

❖ අනුප්‍රාසය භාවිතය
- ගී කිය කියා
- මදක් සැලි සැලී

මෙබඳු අවස්ථා පැහැදිලි කරමින් උචිත වෙනත් උදාහරණ ද භාවිත කර ඇත්නම් පිළිගන්න.

*උදාහරණ සඳහා ලකුණු 03යි*
*සමස්ත විස්තරයට ලකුණු 07යි*
*මුළු ලකුණු 10යි*

## ප්‍රශ්න අංකය 06

6. **"කටවහර උචිත පරිදි භාවිතය නිසා 'අපටත් දවසක ඉර පායාදෝ' කෙටි කතාව සජීවී ප්‍රාණවත් ස්වරූපයක් ගනී." නිදසුන් තුනක් ඇසුරෙන් මේ කියමන පැහැදිලි කරන්න.** (ලකුණු 10 යි)

## අපේක්ෂිත උත්තර

සජීවි හා ප්‍රාණවත් ලෙස උචිත පරිදි කටවහර යොදාගෙන ඇති අයුරු මෙහි ඇතුළත් සිරියාවතී, සිරියාවතීගේ මව, වනසිංහ ටීචර්, පද්මා මිස්, එන්සෝ නැන්දා, සෝමා, දක්සි යන අයගේ චර්යාවන් හා චින්තනය ආශ්‍රයෙන් යෝග්‍ය පරිදි භාෂාව භාවිතකර ඇති ආකාරය දක්විය යුතු ය.

මේ සෑම තැනකදී ම කටවහර යොදාගෙන ඇත. එසේ යොදාගෙන ඇත්තේ සජීවී, ප්‍රාණවත් හා උචිත වූ ආකාරයෙනි. දෙබස් හා ආත්ම භාෂණවල දී කටවහර යොදාගෙන ඇත. එබඳු නිදසුන් තුනක් දක්වා තිබීම ප්‍රමාණවත් ය.

WWW.OLEVELAPI.COM

"මම ඩෑස් එක උඩ දිග ඇරගත්ත චිත්‍ර පොත සෝමා ඇඳල ඉවර වෙනකල් මම බලාගෙන හිටියේ පාටකුරක් ඉල්ලාගන්නයි."

"මගේක නම් පල්..ල්..ල්"

"නෑ අනේ මං හිනාවුනේ ඔයාගේ අයිස්කිරිංකාරයාට"

"කහට ඉහෙනවා එහාට වෙයං"

"අම්මේ මං චිත්‍ර තරගෙන තේරුණා"

"පාට පෙට්ටි තමා නැති නාඩගං"

*උදාහරණ සඳහා ලකුණු 03යි*
*සමස්ත විස්තරයට ලකුණු 07යි*
*මුළු ලකුණු 10යි*



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....

**ප්‍රශ්න අංකය 07**

7. "ස්ථිර අධිෂ්ඨානයෙන් කටයුතු කිරීම ජීවිතය ජය ගැනීමට මඟ පෙන්වයි." හත්ථ හත්ථික සිටාණන්ගේ කතාව ඇසුරෙන් නිදසුන් **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

**අපේක්ෂිත උත්තර**

බත්බැලයා සිය ආසාව මුදුන්පත් කරගැනීම සඳහා තුන් අවුරුද්දක් බැල මෙහෙවර කිරීම හා ඒ වෙනුවෙන් බත් තලියක් ලැබීම.

බත් බැලයා තමාට ලැබුණු බත් තලිය සම්පූර්ණයෙන් ම පසේ බුදුන්ට පිළිගැන්වීම. පසේ බුදුන් මේ බත් තලිය 500ක් පසේ බුදුන්ට බෙදාදීම එමගින් පින් රැස්කර ගැනීමට සැලසීම.

ගන්ධක සිටාණන්ගේ වස්තුවෙන් එක් භාගයක් බත් බැලයාට ලැබීම පසුව රජතුමාගෙන් බත් බැලයාට සිටු තනතුරු ලැබීම ආදී අවස්ථා දක්වා බත් බැලයා දියුණු වන ආකාරයත් එහිදී ඔහු තුළ ඇති අධිෂ්ඨානය ගැන යෝග්‍ය නිදසුන් මඟින් කරුණු දැක්වීම අවශ්‍යයි.

*උදාහරණ සඳහා ලකුණු 03යි*
*සමස්ත විස්තරයට ලකුණු 07යි*
*මුළු ලකුණු 10යි*

WWW.OLEVELAPI.COM



අ.පො.ස සාමාන්‍ය පෙළ සියලුම විෂය ධාරාවන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් හා තවත් බොහෝ දෑ ලබාගැනීමට පිවිසෙන්න www.olevelapi.com වෙත ....